# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2220/69 - 2021 මාර්තු මස 26 වැනි සිකුරාදා - 2021.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

**4 වන වගන්තිය යටතේ වූ නියමය**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 4 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින් මෙම නියමය මගින් මෙහි දක්වා ඇති අරමුණු, නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ඕනෑම හෝටලයකට (හෝටල්), ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු සිදු කළ හැකි බව නියම කරමි ;

පනතේ 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් තම සන්තකයේ තබා ගෙන ඇති ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයින්ගෙන්, හෝටල් මගින් ඔවුන්ට ලබා දෙන සේවාවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් ලබා ගැනීමට එම හෝටල් සඳහා අවසර දෙනු ලැබේ.

එසේ අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල් ;

(අ) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග අදාළ හෝටලය නමින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (BFCA) තැන්පත් කිරීම, හෝ

(ආ) ගනුදෙනු සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු බලයලත් වෙළෙන්දෙකුට විකිණීම

සිදු කිරීමකින් තොරව අත්පත් කර ගත් දිනයේ සිට දින හතක (07) කාලසීමාවක් ඉක්මවා මෙම හෝටල් සන්තකයේ තබා නොගත යුතු ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04 - 315


1A - G 34063 — 60 (2021/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*